ජාතික සමාජ සංවර්ධන ආයතනය - **2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනයේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 104 | 2013 වසරේ සිට 2023 ජුනි 09 විගණිත දින දක්වා පුස්තකාලයෙන් බැහැරට නිකුත් කල රු.71,937 ක් වටිනා පොත් 97 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කර නොතිබුණි | මේ පිළිබඳව ආයතන පාලක සභාවට 2023 ජුනි 30 දින පාලක සභා පත්‍රිකාවක් ඉදිරිපත් කර උපදෙස් පතා ඇත. තවද ආයතන විගණන හා කළමනාකරණ කමිටුවට ද මේ පිළිබඳව කරුණු වාර්තා කරන ලදි. පාලක සභා තීරණ අනුව ඉදිරියේ දී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,762,788ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු14,190,332ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,572,456ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුහුණු අංශය විසින් ශාස්ත්‍ර අයකිරීමේ ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i. 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාලව යාපනය, තලාව, නුවර සහ අම්පාර යන ස්ථානවල පවත්වන ලද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව මාස 21 ක කාල පරාසයක් තුල නිම කිරීමට 2019 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම පාඨමාලා අවසන් කර මාස 16 සිට මාස 22 ක් අතර කාලයක් ගත වී තිබුණද පාඨමාලා නිමකල සිසුන් සඳහා සහතික පත් ප්‍රදානය කිරීම 2023 වර්ෂය දක්වා ප්‍රමාද වී තිබුණි. | 2019 වර්ෂයේ යාපනය, තලාව, නුවර සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි ආරම්භ කරන ලද පාඨමාලාවන්හි නියමිත කාලවකවානුව තුළ පංති කාමර දේශන අවසන් කළ නමුදු ක්ෂේත්‍ර පුහුණුව නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට නොහැකි විය. නමුත් 2022 වර්ෂයේ පාඨමාලා අවසන් කරන අවස්ථාවේ එම වර්ෂයට අදාළ සහතික ප්‍රදානෝත්සවය පවත්වා අවසන් බැවින් 2023 වර්ෂයේ පැවති සහතිකපත්‍ර ප්‍රධානෝත්සවයේ දී සහතිකපත්‍ර ප්‍රධානය කරන ලදී. | සහතික පත් ලබාදීම ප්‍රමාදයකින් තොරව සිදුකල යුතුය. |
| ii. 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාලව ස්ථාන 5 කදී උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා 05 ක් පවත්වා අවසන් කර තිබූ අතර (පාඨමාලා කාලය මාස 21) අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම 2023 වර්ෂය දක්වා ප්‍රමාද වී තිබුණි. | පාඨමාලාවන්හි අධ්‍යයන කැලැන්ඩර් වලට අනුව දේශන පැවැත්වීම හා ක්ෂේත්‍ර පුහුණුව කල්පමා කිරීමට සිදුවිය. නමුත් එසේ ප්‍රමාදවූ පාඨමාලාවල සියළු කටයුතු අවසන් කර සිසුන් සහතික පත්‍ර ප්‍රදානය ද පවත්වා අවසන් කර ඇත. | නියමිත කාලයන් තුල ප්‍රතිඵල නිකුත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | ආයතනය විසින් අධ්‍යයන වර්ෂ 04 ක් තුලදී ගාස්තු අය කල ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාවෙන් සියයට 10 සිට සියයට 21 අතර ප්‍රමාණයක් පාඨමාලාව අතහැර ගොස් තිබුණි. | ශිෂ්‍ය ලියාපදිංචියෙන් අධ්‍යයන වර්ෂ 02 ක් දක්වා පාඨමාලාව සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ සිසුන් සඳහා නැවත වතාවක් පාඨමාලාව සම්පූර්ණ කිරීමට මෙම පාඨමාලාවේ අතුරු ව්‍යවස්ථාව අනුව අවකාශ සලසා දී ඇත. | පාඨමාලා හැරයාමට පෙර සිසුන් රඳවාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| iv. | වසර 02 සිට 05 දක්වා වූ කාල පරාසයකට අයත් ලැබිය යුතු පාඨමාලා ගාස්තු වශයෙන් රු.5,450,650 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැනට පාඨමාලාව හැර ගිය සිසුන්ගේ මුදල් ලැබී නොමැති බැවින් තත්‍ය තත්ත්වය සඳහා වැය ලේඛණ සකස් කිරීමට කටයුතු සිදු කර ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික සමාජ සංවර්ධන ආයතනය පුස්තකාලය සඳහා 2013 වසරේදී රු.375,000ක මුදලකට මිලදී ගත් මෘදුකාංගයක් 2019 වසරෙන් පසු භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | අප විසින් සියලුම දත්ත සුරක්ෂිතව ගබඩා කර තබාගෙන පවතින අතර නව පරිගණක යන්ත්‍රයක් ලැබුණු විට එම දත්ත පරිගණක යන්ත්‍රයට ඇතුලත් කර පූර්ණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | අවශ්‍යතාවය අනුව මිලදීගැනීම් කල යුතු අතර වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |